# Living the LOTUS

Buddhism in Everyday Life

8
2019

VOL. 167


## Founder's Essay

### ඒකඟත්වය පලකිරීමේ ආදර වදන්

'කිසිම තැකීමක් නොමැතිව, මේ වගේ වැඩ කරන්න පුළුවන් නේ' ලෙස හිතෙන ආකාරයේ පුදුම සහගත දෑ කරන පුද්ගලයන් ඔබලාගේ අවටද සිටින්නට පුළුවන්. ඉවසීම දරා ගැනීමට නොහැකි වු විට, 'මේ පුද්ගලයා නම්, කොයි වගේ කෙනෙක්දෝ' ලෙස සිතෙයි. නමුත් එක් වරක් හෝ එම පුද්ගලයාගේ තත්වයට පත්ව කල්පනා කර බැලීම හොදය.

බොහෝ විට එම පුද්ගලයාද, අවටින් එල්ලවන විවේචන හා අඩන්තේට්ටම් හමුවේ හදවත හකුලුවාගෙන, තමාව ආරක්ෂා කර ගැනීමට නොයෙක් විධියේ උත්සහයන් දරණවා යැයි සිතමි. එබැවින් වධහිංසා පමුණුවමින් තමාව නිවැරදි කිරීමට කටයුතු කරන අයට, ඇහුම්කන්දීම නොකරයි.

එම තැනැත්තා විසින්ම තම හද පත්ලෙන්ම 'මේ විධියට කරන්න හොද නැහැ නේ' යන හැගීමට පත් නොවෙන තාක් කල්, අපි කොපමණ හඬ නගා කිවද වෙනසක් ඇති නොවේ. වැදගත්ම දේ වන්නේ, එම තැනැත්තා හද පත්ලෙන්ම අවංක කටයුතු කරන ආකාරයට පත්වීමට අප කල යුත්තේ කුමකද ලෙස කල්පනා කර, ඒ ආකාරයට කටයුතු කිරීමයි. ඒ වෙනුවෙන් එක් මොහොතක එකිනකාගේ හදවත් වල බැදීම වැදගත් වේ.

හිතුවක්කාරව කටයුතු කරමින් තමාව ආරක්ෂා කරන අය බලාපොරොත්තු වන්නේ, තමාට පක්ෂග්‍රාහි වන පුද්ගලයන් සිටීමය.

'ආදර වදන්' තුල කාරුණික වදන් යන අරුථ ගැබ් වී තිබේ. කතාවට දක්ෂ කෙනෙකු නොවුනත්, අන්‍යයන්ව විශ්වාස කර, එම පුද්ගලයන් කරන්නාවු දෝෂාරෝපනයන්ට හදවතින්ම ඒකඟත්වය පළ කිරීම පමණක්ම වටිනා ආදර වදන් බවට පත්වේ.

*Kaiso zuikan* 9 පි. 232-233


**Living the Lotus**
**Vol. 167 (August 2019)**

Senior Editor: Koichi Saito
Editor: Kensuke Suzuki
Copy Editor: P.A.D. Somapala, G.N. Ruklanthi, Sahan Chamara

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International, Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජිවීතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සගරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*

# තම 'වටිනාකම' වැඩි වන සේ දීප්තිමත් වීම



නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## ආත්ම ශක්තිය ගොඩනගා ගැනීමට අසිරු කාලයකි

අනෙකුත් පුද්ගලයන් හා ගෙවල් සමඟ සසදාලමින්, තමා හා තමාගේ ගෙදර ගැන දරුවන් පසුතැවිල්ලෙන් කතා කරන විට, දෙමාපියන් නිතරම 'අපිට අනුන්ගේ දේවල් වැඩක් නැහැ, තමන්ගේ පාඩුවේ ඉන්න' ලෙස පවසයි. අපි සැවොම එකිනෙකාට වෙනස් ජීවන ගමනක් ගත කරන නිසා, අන්‍යයන් සමඟ තමාව සැසඳීමේ අවශ්‍යතාවක් නැති බව එයින් පැහැදිලි වේ.

නමුත්, මනුෂ්‍යයන්ට ඊර්ෂ්‍යයා කරමින් තවත් විටෙක හීනමානය ඇති කර ගැනීමත් සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවය වේ. එසේම, තවත් පිරිසක් දුක් වේදනාවන් ඇති වූ විට, එය තම හැකියාව ඔපදමා ගැනීමට හා දියුණුව වැඩිකම ගැනීමට ලැබෙන උද්දීපනයක් (ස්ප්‍රින් එකක්) සේ සලකයි.

බුදු දහමේදී, අන්‍යයන් හා තමාව සැසඳීම තුලින්, තම දැක්මට අඳුරු වලාවන් එක් කර ගනියි සේ සදහන් වේ. අනික් අතට අන්‍යයන් කෙරෙහි ඊර්ෂ්‍යයාවක් ඇති වූ විට වුවද, ඊට එහා අනවශ්‍ය ආකාරයට එම හැඟීම වර්ධනය නොවන ආකාරයට තම හදවත පාලනය කර ගැනීම වැදගත් වේ.

නමුත් වර්තමානයේ හීනමානය තුලින් ජීවිත බලාපොරොත්තු කඩ වී 'තම ජීවිතයෙන් ඵලක් නැතැයි' සිතන පිරිස වැඩි වී ඇතැයි සිතමි.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 'විශ්වාසය හා අවබෝධය' යන 4 වන පරිච්ඡේදයේ 'දිළිඳු පුත්‍රයාගේ උපමා කථාවේ' සදහන් දිළිඳු පුත්‍රයා ද එවැනි කෙනෙකි. තැන තැන ඇවිද ඉතා දිළිඳු ජීවිතයක් ගත කරමින් සිටියද, තමාට නවාතැන් සැපයූ සිටුවරයාගේ විශ්වාසය තුලින් රන් රිදී තැන්පත් කර ඇති භාණ්ඩාගාරයේ වගකීම ලැබුනි. නමුත් 'මම මේ ආකාරයේ වගකීම් දැරීමට සුදුසු කෙනෙක් නොවේ' සේ දාස භාවයේ හීන මානය තුරන් නොවීය.

එම දිළිඳු පුත්‍රයා සේ ආත්ම ශක්තිය නොමැති පිරිස වැඩි වී ඇත්තේ, බලාපොරොත්තු වලට උත්තේජනයන් ලබදෙන තොරතුරු වල වැඩිවීම තුලින් ආර්ථිකමය පරතරය හා ජීවිතයට ලබා ගත හැකි දේ වල අඩු වැඩි බව ඉතා පහසුවෙන් තක්සේරු කිරීමට හැකිව තිබෙන නිසා නොවේද?

# බුද්ධ ශක්තිය දීප්තිමත් කර ගැනීම

උදාහරණයක් ලෙස, ‘අන්‍යයන්ට වඩා දිළිඳු වීම, අසතුටක් හා දුකක්’ සේ තක්සේරු කරයි. එම තක්සේරු ක්‍රමය සුදුසු නොවුනත්, එයම තම ආත්ම ශක්තිය හා බලාපොරොත්තු බිඳ හෙලීම තක්සේරු කරන කරුණක් සේ පාදක කරගෙන ‘කිසිම සතුටක් නැතැයි’ තීරණය කරනුයේ, වෙන කවරෙකුවත් නොවේ තමාමය. අපගේ ජීවිතය ‘සබඳතාවයන්ට’ අනුකූලව වෙනස්වීම් වලට ලක්වේ, ස්ථාවර කිසිම දෙයක් නොමැත. නමුදු, ඒ ආකාරයේ ලේබල් අලවාගෙන තම ආත්ම ශක්තිය හා බලාපොරොත්තු අතහැර ගැනීම, අප ලබා තිබෙන ජීවිතයට කර ගන්න අපරාධයකි.

දියුණුවීමේ ආශාව හා හීනමානය කාසියක දෙපැත්ත මෙනි. හද පත්ලේ ‘වඩා හොඳ ජීවිතයක් ගත කළ යුතුයි’ සේ ප්‍රාර්ථනයක් ඇති බැවින්, විටෙක බලාපොරොත්තු විරහිත හැඟීම දළු ලා වැඩෙන්නේ. එහෙත්, තම අසතුටට හේතුව තමා අවට ලෝකය හා අන් අය ලෙස පිටතට පවරන විට, එම හීනමානය දෝෂාරෝපණයට පමණක් සීමා වී තම දියුණුවට යා නොවේ.

කලින් සඳහන් කළ ‘විශ්වාසය හා අවබෝධය’ යන පරිච්ඡේදයේ සිටුතුමාගේ අවසාන මොහොතේ සියළුදෙනාම ඉදිරියේ ‘දිළිඳු පුතාට’, ‘මෙම තරුණයා කාලයක් අතුරුදහන් වී සිටි මාගේ පුත්‍රයායි. මගේ වස්තු සම්භාරයේම අයිතිය මොහුටය’ සේ පැවසූහ. එය දාස භාවයේ හීනමානයෙන් දිළිඳු පුත්‍රයා මිදී, තමාගේ වස්තු සම්භාරය ගැන අවබෝධ කරගත් මොහොතයි. මෙම වදන තුල ‘සෑම සියළු දෙනාම බුදුන්ගේ දරුවන්ය, බුදුන් වහන්සේ හා සමානව බුද්ධ ශක්තිය තිබේ. එබැවින් ආත්ම ශක්තියෙන් යුතුව තම වටිනාකම වන බුද්ධ ශක්තිය වැඩිවන සේ දීප්තිමත් වන්න’ සේ පැවසූහ.

එසේම, තමාගේ ‘වටිනාකම’ අවබෝධ කර ගැනීමෙන් සතුටු වනවා පමණක් නොව, එම කරුණ ගැන නොදන්න අයට පැහැදිලි කර දීම තුලින්, එම පුද්ගලයන්ගේ ‘වටිනාකම’ වැඩිවන ආකාරයට කටයුතු කිරීමට සහයෝගය දීම තුලින්, තම ‘බුද්ධ ශක්තිය’ තව තවත් වැඩිවන බව කියාදේ.

ධර්මය විශ්වාස කර අවබෝධ කර ගැනීම ‘විශ්වාසය හා අවබෝධය’ වේ. සෑම මනුෂ්‍යයෙකු  තුලම එක හා සමානව ‘බුද්ධ ශක්තිය’ නම් වටිනාකම තිබෙන බව ‘විශ්වාසය හා අවබෝධය’ ඇතිකර ගෙන, ආත්ම ශක්තියෙන් යුතුව ජීවිතය ගත කරමු.

From *Kosei*, August 2019

# ශ්‍රද්ධාවන්තව ධර්මය ඇදහීමෙන් මා උදාකරගත් සතුට

දුලාල් බරුවා
බංගලාදේශ ශාඛාව

මෙම සෙප්පෝව 2018/10/26 වන දින බංගලාදේශ ධර්ම ශාඛා වේ 20 වන සංවත්සර උත්සවයේදී සිදුකරන ලදී.

සියළු දෙනාගෙන්ම අවසරයි.

මාගේ නම දුලාල් බරුවා. මගේ බිරිද ලිලී, දූවරු දෙදෙනාත් සමඟ පවුලේ සාමජිකයන් හතර දෙනෙකි. මම කොක්ස් බසාර් ප්‍රදේශයේ රාමු ධර්ම ශාඛාවේ ශිබුචෝ විධියට කටයුතු කරමින් සිටිනවා.

අද දවස බංගලාදේශ ශාඛාවට ඉතාමත් වටිනා, ඉතිහාසයට එකතුවන දවසක් වේවා යැයි සිතනවා. මෙවන් වටිනා දවසක සෙප්පෝවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදුන්නාට අරිතොමි ක්යෝකයිචෝ සාන් ඇතුළු සාමාජිකයන් සියළු දෙනාටම හදවතින්ම ස්තූතිවන්ත වනවා.

මම 2012 වසරේ 3 වන මස 1 වන දින රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ විය. මාව සංවිධානයට මිච්බිකි කළ සුනිල් බරුවා සාන්ට හදවතින්ම ස්තූතිවන්ත වනවා. මාගේ නිවසේ බුදු පිළිමය තැන්පත් කල දිනයේ සිට මේ වන තෙක් සහයෝගය ලබාදුන් අශෝක් කුමාර් ශිබුචෝ සාන්ටත් හදවතින්ම ස්තූතිවන්ත වනවා.

කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වීමට පෙර මම රැකියාවක් කරන අතර සමාජ සුබසාධාන කටයුතු වලද නිරත වුනා. නමුත් එක් අවස්ථාවක එක පාරටම ශරීරය දුර්වල වී ඇවිදීමට පවා අපහසු තත්වයකට පත්වුනා. ඇවිදීමට නොහැකිව ඇඳේ නිදගෙන සිටීමට සිදු වූ නිසා, රැකියාවටද යාමට නොහැකිව රැකියාවෙන්ද අස්වීමට සිදුවිය. ප්‍රතිකාර වලටද මුදල් වැය වීම නිසා ජීවත්වීමටද මුදල් නොමැතිව ණය බර එන්න එන්නම වැඩි විය. මානසිකවද පීඩනයකට ලක් වී ක්‍රමයෙන් මානසික තත්වයද දුර්වල වී, මම අවාසනාවන්තයෙක් ලෙස හැඟී, අනික් අය සමඟ කතා කිරීම පවා එපා විය. ශාරීරිකවද, මානසිකවද, මුදල්මය අතින්ද විශාල ප්‍රශ්ණ ඇති වී, දුක්බර කාලවකවානුවක් විය.

මේ කාලයේ එක් දවසක් සුනිල් බරුවා සාන්ව හමුවිය. සුනිල් සාන් කෝසෙයි කායි සංවිධානයේ නායකයන් සමඟ මාගේ නිවසට පැමින, තෙදොරි සිදු කරන අතර කෝසෙයිකායි සංවිධානයේ ඉගැන්වීම් කියාදුන්නා. පළමු වතාවට නික්යෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් ඉගෙන ගන්නා විට, ටික මාගේ හදවත වෙනස් වී, සැහැල්ලුවට පත්වන බව දැනෙන්නට විය.

මාව තෙදොරි කිරීමට පැමිනි ආශිර්වාදය නිස, කන්දක් ලෙස තිබූ මාගේ ප්‍රශ්ණද ක්‍රමයෙන් විසද ගැනීමට මග පෑදී, අන් අය සමඟ කතාබහ කරමින් කටයුතු කිරීමටද හැකියාව ලැබින. ඉන්පසු රාමු ධර්ම ශාඛාවට ගොස් සූත්‍ර සක්ඣායනයට සහභාගි විය. නික්යෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් පුරුදු පුහුණු කරන විට, මාගේ හදවත නිවැරදි මාර්ගයට ගමන් කරන බව වැටහී සතුටක් දැනෙන්නට විය. ඒ අවධියේ සුනිල් සාන් කෝසෙයි කායි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්නා ලෙස පැවසුවා. ජීවිතය ගතකිරීමේ නිවැරදි මාර්ගය කෝසෙයි කායි සංවිධානය තුළින් ඉගෙනගෙන, ධර්මය පුරුදු පුහුණු කරමින් ධර්මය අවබෝධ කිරීමේ වටිනාකම වැටහී තිබූ නිසා කිසිම පැකිලීමක් නොමැතිව මම සාමාජිකත්වය ලබා ගත්තෙමි.

සාමාජිකත්වය ලබා ජේෂ්ඨ පිරිමි කණ්ඩායමේ සාමාජිකයන් සමඟ වැඩකටයුතු කිරීමට පටන් ගත්තා. ධර්මයේ පිහිටෙන් මාගේ ජීවිතය හොඳ ආකාරයට වෙනස්



බංගලාදේශ ශාඛාවේ සෙප්පෝව පවත්වන දුලාල් බරුවා මහතා

විය. මාගේ වෙනස් වීම දැක අසල්වාසීන්ද පුදුමයට පත්විය. මම අසල්වාසීන්, හිත මිත්‍රයන්ද තෙදොරි, මිච්බිකි කිරීමට පටන් ගත්තා. රාමු ධර්ම ශාඛාවේ නායකයන්ගේද සහයෝගයෙන් මේ වනවිට 50 දෙනෙකුට වැඩි පිරිසක් මිච්බිකි කිරීමට හැකිවිය. මාගේ පවුලේ අයත් ධර්මය පිළිබඳ පැහැදීමෙන් මාත් සමඟ වැඩසටහන් වලට සහභාගී වෙමින් කටයුතු කරනවා.

2014 වර්ෂයේ 5 වන මස 2 වන දින, මම රාමු ශාඛාවේ ධර්ම නායකයෙක් බවට පත් වී, නික්යෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් තවත් ගැඹුරින් ඉගෙනීමට උවමනායැයි සිතා සිටින විට බැංකොක් ශාඛාවට ගොස් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙනීමේ සම්මන්ත්‍රණයකට සහභාගී වීමට අවස්ථාවක් උදාවිය, 'අනායයන් ප්‍රථමයෙන්', 'අන් අයගේ ප්‍රශ්න, දුක් කරදර තමාගේ යැයි සිතා කටයුතු කිරීම' වැනි වැදගත් දෑ ගැන ගැඹුරින් ඉගෙන ගැනීමට හැකියාවක් ලැබින. මේ වනතෙක් අන් අයට උදව් කරන්න ඕනා යැයි හැඟීමක් මට ඇති නොවුනත්, සම්මන්ත්‍රණයට සහභාගි වීමෙන් ඒ වැදගත්කම අවබෝධ කර ගැනීමට හැකිවිය. ඉන්පසු බැංකොක් වලදී ඉගෙනගත් දෑ බංගලාදේශ ශාඛාවේදී පුරුදු පුහුණු කරමින්, එක් අයෙකුට හෝ මේ ධර්මය කියාදෙන්න උත්සහයෙන් කටයුතු කරමින් සිටිනවා.

2016 වර්ෂයේ 6 වන මස 17 වන දින ජපානයේ මූලස්ථානයට ගොස් බුදු පිළිම වහන්සේ ලබා ගැනීමට හැකිවීමත්, එම වර්ෂයේම 10 වන මස 23 වන දින ධර්මාචාර්යය (ධර්ම නායක)ලබා ගැනීමටද හැකියාව ලැබින. ජපානයේ ධර්ම ශාඛාවකට පුහුණුවකට ගිය අවස්ථාවේ තෙදොරි, මිච්බිකි වලට සහභාගී වීමට ලැබීම ලොකු අත්දැකීමක් විය. 2017 වර්ෂයේ 4 වන මස 1 වන දින රාමු ශාඛාවේ ශිබුචෝ බවට පත් වීමට වාසනාව ලැබින.

මම ශිබුචෝ ලෙස කටයුතු කරන විට විශාල පිරිසක සමඟ කටයුතු කිරීමට අවස්ථව ලැබින. හමුවන සෑම කෙනෙකුවම බුදුන් වහන්සේගේ මාර්ගයට ගැනීමට හදවතින්ම ප්‍රාර්ථනා කරමින් මාගේ වගකීම දරනවා. මෙතෙක් ලැබූ අත්දැකීම්, ඉගෙනගත් දෑ තුළින්, දුකට පත් වූ අයට ශක්තියක් ලබා දෙන කෙනෙකු බවට පත්වීමට බලාපොරොත්තු වෙමි. නායකයෙකුගේ වගකීම වනුයේ කරුණාවන්ත හදවතින් අන් අයගේ සතුට වෙනුවෙන් කැපවී කටයුතු කිරීම යැයි මම සිතනවා. 'දැන් ඔබට පැවරී තිබෙන රාජකාරිය, බුදුන් වහන්සේගෙන් ලැබුන දයාදයක්' යැයි උපදේශයක් ලැබුනා. මෙම වගකීම තුළින් බුදුන් වහන්සේගේ ධර්මය ව්‍යාප්ත කිරීමට කැපවීමෙන් කටයුතු කරමින් සිටිනවා.

මේ අවස්ථාවේ අරිතොමි ශාඛා ප්‍රධානී තුමාට මාගේ ස්තූතිය පුදකර සිටිනවා. මම ශාඛා ප්‍රධානී තුමාගේ ධර්මානුකූල ජීවිතය ගැන පැහැදීමකට පත් වී කිහිප වතාවක්ම සතුටු කඳුලු හෙලපු අවස්ථාද ඇත. ශාඛා ප්‍රධානී තුමා තමාගේ සැපවත් ජීවිතයෙන් බැහැරව අපගේ ජීවිතවල සතුට වෙනුවෙන් සෑම දිනකම කැපවීමෙන් කටයුතු කරමින් සිටිනවා. ශාඛා ප්‍රධානී තුමාට මම හදවතින්ම ස්තූතිවන්ත වනවා. ශාඛා ප්‍රධානී තුමාගේ පිහිටෙන් මාගේ ජීවිතය හොඳ ආකාරයට වෙනස් කර ගැනීමට අවස්ථාව උදාවිය.

සාමාජිකත්වය ලබා අද දවස වන තෙක් ජීවිතය දෙස නැවත හැරීබැලූ, කැපවීමෙන් ධර්මය පුරුදු පුහුණු කරමින් ධර්ම මාර්ගයේ කිරීම තුලින් සතුටක් ලැබෙන බව වටහා ගැනීමට හැකිවිය. ධර්මය පුරුදු පුහුණු කිරීම තුලින් මාගේ ජීවන රටාව වෙනස් වී, අවට සිටිනා අය 'ඔයා ඇත්තටම වෙනස් වෙලානේ', 'කලින්ට වඩා කරුණාවන්තයිනේ' ලෙස පවසන තත්වයටද පත් විය. දැන් මම දුකට පත් වූ කෙනෙක් දුටු විට, කුමන ආකාරයකින් ඒ කෙනාව දුකින් මුදවා ගැනීමට හැකිවේද යන්න සිතන කාලය වැඩි විය. ඒ වාගේම සෑම කෙනෙකුගේම සතුට දැක සතුටට පත් වීමට හැකි අයෙකු බවට පත් වීමට හැකියාව ලැබුන. කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වීමට පෙර මේ වාගේ හැඟීමට පත් වූ එකම අවස්ථාවක් වත් නැත. ධර්ම පුරුදු පුහුණු කරගෙන යන විට, මටත් නොදැනීම කරුණාවන්ත හදවතක් නිර්මාණය වූවා යැයි සිතමි.

සෑම දිනකම ධර්මය පුරුදු පුහුණු කිරීම කන්දක් නැගීමට උපමා කල හැකිය. කවුරුන් වූවත් කන්දක් නැගීමට පෙර තැති ගැන්මකට ලක්වේ. කැලෑ පර දිගේ කන්ද උඩට නගින්න පුළුවන් වේවිද, මඟ පෙන්වන්නා නිවැරදි මාර්ගය පෙන්වාවිද යැයි සිතේ භයක් හටගනී.

අද දින මට, බංගලාදේශ ශාඛාවට 20 වසරක් සපිරෙන උත්සවයේදී සෙප්පෝවක් ඉදිරිපත් කිරීම දක්වා මේ පැමිණි ගමන, කලින් කියූ කන්දක් නැගීමේ කතාවට උපමා කල හැකිය. ගමන් කර ආ මාර්ගය දෙස නැවත හැරී බැලූ විට මම දැන් කන්දේ බාගයකට වඩා වැඩි ප්‍රමානයක් නැග සිටිනවා යැයි සිතනවා. සාමාජිකත්ව ලැබූ මුල් කාලයේ ධර්ම මාර්ගයේ අවසානය දක්වා යාම හැකි වේදැයි බයක් තුබුන අවස්ථාද ඇත. කෝසෙයි කායි සාමාජිකයෙක් බවට පත් වී, ඉගැන්වීම් ඉගෙනගෙන කටයුතු කරද්දි, කන්දක් අමාරුවෙන් නගිනවා සේ, දුක් කරදර තිබුනා. එහෙත්, ශිබුචෝ තනතුර දක්වා පැමිණ, ජපානයේ

මූලස්ථානයට ගොස් නායකත්ව පුහුණුවටද සහභාගි වී, අද වනතෙක් උත්සහයෙන් කටයුතු කිරීමට හැකිවිය. එය මට මිල කල නොහැකි වටිනාම සම්පත් වේ. මෙතනින් නතර නොවී, කන්ද මුදුනට යන ජීවිතයේ අවසාන අරමුණට ලගාවීමට කැපවීමෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.

කවද එම අරමුණට ළඟා වීමට හැකිවේ දැයි නොදනිමි. නමුත් මාගේ හදවත දෙස සැහැල්ලුවෙන් පසු විපරම් කර බැලූ විට, කැපවීමෙන් ධර්මය පුරුදු පුහුණු කිරීම තුලින්, නොසිතූ ආකාරයේ සතුටක් උදකර ගැනීමට හැකිවී තිබෙන බව අවබෝධ විය. කන්ද නැගීමට පෙර පෙනුන පරිසරයට වඩා, කන්ද නැගගෙන ඉහළට යන විට පෙනෙන පරිසරයේ පරසාය විශාලය. ඒ ආකාරයට ධර්මය පුහුණුවේ යෙදීම තුලින් ලැබෙන්නාවූ ආනිශංස තුලින් මාගේ දැක්ම පුළුල් වී, සිතන පතනා ආකාරය වෙනස් විය.

මේ ආකාරයට අපි හදවතින්ම ධර්මය පුරුදු පුහුණු කරන විට විශිෂ්ඨ ආකාරයට හදවතක් ඇති කරගෙන ආනිශංස ලබා ගැනීමට හැකියාව ලැබේ.

මගේ ශක්තියෙන් පමණක් සාර්ථකත්වය ළඟා කර ගත්තා යැයි සිතූ පමණින්, මනුෂ්‍යයන්ගේ හදවතේ අධිමානය ඇතිවේ. අධිමානය තමාව දුකට පත් කරයි. නමුත්, ධර්මය ඉගෙන ගන්නා විට අධිමානයේ හදවතින් ඈත් වී, බුදුන් වහන්සේගේ ආරක්ෂාව යටතේ සිටීම පිළිබඳ ස්තූතිවන්ත හැඟීමකට පත් වේ. එවිට යම් සාර්ථකත්වයක් ඇති වූ විට පවා, සෑම දෙයක්ම අන් අයගේ පිහිටෙන්, ආශිර්වාදයෙන් සිදු වූ බවට නිහතමානීව සිතීමට හැකියාව ලැබේ.

කෝසෙයි කායි සංවිධානයේ සාමාජිකත්වය ලබා, ධර්ම මාර්ගය යන කන්ද නැගීමට ආරම්භ කල කාලයේ, නිවරදි මාර්ගය පෙන්වා දේවිද යන්න භයක් තිබ්න. නමුත් දැන් ගමන් ගත් මාර්ගය නිවැරදි බව වැටහින. ඒ වාගේම කවද හෝ නියත වශයෙන් කන්ද මුදුනට යාමට හැකිබව විශ්වාසයෙන් සිටිනවා. අවසානය තෙක් සැමදෙනා සමග එකට එක්ව මේ ධර්ම මර්ගයේ ඉදිරියට ගමන් කරනවා.

ඒ වෙනුවෙන් සෑම කෙනෙකුගේම බුද්ධ ස්වභාවයට ගරු කරමින්, එක් අයෙකුට හෝ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ විශිෂ්ඨ ඉගැන්වීම් කියාදී, සාමාජික අධිෂ්ඨානයේ ඇති ආකාරයට ‘රටවලත්, ලෝකයේත් සාමය ඇති කිරීමට’ කටයුතු කිරීමට අධිෂ්ධාන කරමින් මාගේ සෙප්පෝව අවසන් කරනවා.

සියළුදෙනාටම බොහොම ස්තූතියි.



*දුලාල් ශිබුචෝ සාන්, රාමු ශාඛාවේ සාමාජිකයන් සමග*

Living the LOTUS

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 10 වන පරිච්ඡේදය, ධර්මාචාර්යතුමෙක (පෙර කොටස)

### ධර්මාචාර්යතුමෙක් යනු

ධර්මාචාර්ය යනු, පැවිදි භික්ෂූන් වහන්සේලා පමණක් නොවේ. අන්‍යයන් වෙනුවෙන් ධර්මය දේශනා කරන සියළුම අයව ධර්මාචාර්යතුමාලා ලෙස හඳුන්වයි. මෙම පරිච්ඡේදයේදී ධර්මාචාර්යතුමන්ලා හදවත පවත්වාගත යුතු ආකාරය පැහැදිලි කර දේ. විශේෂයෙන් බුද්ධ පරිණිර්වානයෙන් පසු අවධිය බැවින් කුමන හැඟීමෙන් ධර්මය දේශනා කළ යුතුද, එසේම නිවැරදිව ධර්මය දේශනා කිරීම තුලින් ලැබෙන්නාවු ආනිශංස සඳහන් වන බැවින් අපගේ ආගමික ජීවිතයට ඉතාමත් වැදගත් වන පරිච්ඡේදයක් වේ.

මෙහිදි සැලකිලිමත් විය යුතු කරුණ නම්, මෙම පරිච්ඡේදයේ සිට බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන්නේ බෝධිසත්වයන් වහන්සේලාටය. මේ දක්වා ශ්‍රාවක, ප්‍රත්‍යයෙක බුද්ධ හා බෝධිසත්වයන් ලෙස වර්ග කර තිබුණද, 'ආනන්ද තෙරුණ්ට විවරණ ලබාදීම' යන 9 වන පරිච්ඡේදයේ' දී 'ඒ ආකාරයේ වර්ග කිරීම් නොමැත, සියළු දෙනාම බෝධිසත්වයන් වේ. සියළුදෙනාම බුදු බවට පත්වීමේ මාර්ගයේ ඇවිද යයි' නැවත නැවත දේශනා කරමින්, එය ශාක්ෂාත් කිරීමට විශාල ශ්‍රාවක පිරිසකට (ප්‍රත්‍යයෙක බුදුන් ඇතුළුව) විවරණ ලබාදුනි.

එබැවින්, මින් ඉදිරියට බුදුන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කරන සියළුදෙනාම බෝධිසත්වයන් වේ. ධර්ම දේශනාවට සවන්දෙන්නේ කලින් සිටි පිරිසම වුවත්, සවන් දෙන හැඟීම වෙනස් වී, මනුෂ්‍යයෙකු ලෙස තිබෙන්නාවු අවබෝධයද වෙනස් වී ඇත. ඒ අනුව සියළුදෙනාම බෝධිසත්වයන් වන බැවින්, මේ දක්වා ශාරිපුත්‍රයනි, මහා කාශ්‍යපයනි, මේ මේ භික්ෂුවනි ලෙස හැඳින්වූ පිරිස වෙනස් වී භෛෂ්‍යරාජ බෝධිසත්වයනි, මංජු ශ්‍රී බෝධිසත්වයනි, මේ මේ බෝධිසත්වයනි ලෙස වෙනස් වේ.

### ශ්‍රවණය කිරීමේ ප්‍රීතිය

බුදුන් වහන්සේ විසින් 'මම දේශනා කරන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ එක් ගාථාවක් හෝ එක් පද පෙලක් ශ්‍රවණය කර එක් මොහොතක හෝ ''විශිෂ්ඨයි, විශිෂ්ඨයි'' සේ සිතන පිරිස සිටිනවා නම්, ඔවුන් අනුත්තර සම්‍යක් සම්බෝධිය ලබන බව මම පවසමි. ඒ එම තැනැත්තා අනිවාර්යයෙන්ම සත්‍යාවබෝධය ලබා ගන්නා නිසාය' සේ දේශනා කලහ. සාමාන්‍ය ලෝකයේදීද, විශිෂ්ඨ වු දේ වලට පවා නිහතමානීව කැමැත්තක් ඇති කර ගන්නා පිරිස සාර්ථකත්වයට ලගා වන බවට උදාහරණ ඕනෑතරම් තිබේ. කැමැත්තක් හෝ ප්‍රබෝධයක් නොමැතිව තමා වාසිය පමණක් ගැන සිතා කටයුතු කරන පිරිසට ලබෙන්නේ කුඩා සාර්ථකත්වයක් හා සුළු සැනසීමක් පමණි, ඉන් එහා සාර්ථකත්වයක් නොමැති වේ. ඉතිහාසගත වන කටයුත්තක් කිරීමට නොහැකිවේ.

ශ්‍රද්ධාවන්ත ජීවිතයක් ගත කිරීමද ඒ සමානය. බුදුන් වහන්සේ දේශනා කල ධර්මය විශිෂ්ඨත්වයෙනුත් විශිෂ්ඨ වේ. එම ධර්මය අසා නිහතමානීව සතුටු වී, නිහතමානීව විශ්වාස කරන්නේ නම් එය එම තැනැත්තාගේ අනිවාර්යය වු අසීමිත දියුණුවක් ඇති කර ගැනීමට පාදක වේ.

### මෙලොවට ඉපදීමේ ප්‍රාර්ථනය

බෝධිසත්වයන් ලෙසින් සිටින නිසා බුදු බවට පත්වීමට හැකි වුවත්, එවන් ශුද්ධ භූමියක ඉපදීම අතහැර දමා 'සියළු සත්වයන් කෙරෙහි පැතිරුන කරුණාවෙන් යුතුව මේ මිනිස් ලෝව ඉපිද' ලෙස සඳහන් පරිදි තමා විසින්ම ප්‍රාර්ථනා කර්ගෙන 'මනුෂ්‍යයකු' ව මේ ලෝකයට ඉඳීමයි. කුසල් අකුසල් අනුව නොව, සියළු සත්වයන්ව දුකින් මුදවා ගනිමු යන හැඟීම හා මෛත්‍රිය කරුණාවේ හදවතට අනුකූලව ඉපදීම සිදුවේ.

එබැවින්, 'තමා බෝධිසත්වයෙකු ලෙසින් මේ ලොවට ඉපදුන' බව අවබෝධ කරගත් විට, බෝධිසත්වයෙකු ලෙස කටයුතු කිරීමට සැමටම හැකිවේ. මන්ද යත්, බුදුන් හා



බෝධිසත්වයන් වහන්සේලාට තම අධිෂ්ඨානය මතින් ඕනෑම ශරීරයකට වෙනස් වීමටත්, ඕනෑම ස්ථානයක ඉපදීමට හැකි නිසාය. එනම්, ඕනෑම ආකාරයකට තම ශරීරය වෙනස් කර ගැනීමට හැකියාව ඇත. ඒ අනුව මේ ලොවට ඉපිද, හදවතින්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පිළිගෙන ධාරණය කරගෙන ශරීරයම කැපකරමින් ධර්මය ප්‍රචාරය කරන පුද්ගලයන්ව, සාමාන්‍ය පුද්ගලයන් ලෙස පෙනුනද, සත්‍ය වශයෙන්ම බුදු කෙනෙක් හෝ බෝධිසත්වයන් කෙනෙක් මේ ආකාරයට මනුෂ්‍යයෙකු ලෙස ශරීරයට වෙනස් කරගෙන සිටින බව අවබෝධ කර ගත යුතුය. එසේ හෙයින් එවැනි පුද්ගලයන්ට ඉමහත් ගෞරවාදරයක් දැක්විය යුතුය.

තමා විසින්ද එම කරුණ අවබෝධ කර ගැනීම වැදගත්ය. එය අධිමානය නොවේ. ඒ ආකාරයේ අවබෝධය තබා ගැනීම තුලින් අයහපත් දෑ කිරීමට නොහැකි වේ. අන්‍යයන් වෙනුවෙන්, ලෝකයේ යහපත වෙනුවෙන් කටයුතු කිරීමට සිදුවේ. එවිට හදවතේ පවිත්‍රත්වය තුලින් හදපත්ලෙන්ම ඇතිවන හැඟීමෙන් ඉබේම පරාර්ථකාමීව කටයුතු කිරීමට හැකි වනවාසේම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය කැපවීමෙන් ප්‍රචාලනය කිරීම සිදු කරයි. එයම බෝධිසත්වයෙකුගේ කාර්යය වේ.

## ප්‍රීතිය වැඩි කර ගැනීමේ සූත්‍ර සක්ඣායනය හා ධර්ම පුහුණුව

මේ ආකාරයට බෝධිසත්වයෙකු ලෙස අවබෝධය තුලින්, නිකම්ම ශ්‍රවණය කිරීම තුලින් 'විශිෂ්ඨයි' ලෙස ලැබූ සතුට එක් වරකින් පමණක් අමතක නොකර මතකයේ තබා ගැනීම තුලින් 'ශ්‍රවණය කිරීමේ ප්‍රිතිය' තවත් වැඩි කර ගැනීමට හැකිවේ. එනම්, එක් වරක් ශ්‍රවණය කර, එය හදවතේ බද්ධ කර ගැනීම තුලින් 'ශ්‍රවණය කිරීමේ ප්‍රිතිය' වටිනාකම වැඩිකර ගැනීමට හැකිවේ.



එනම්, 'ශ්‍රවණය කිරීමේ ප්‍රිතිය' දියුණු කර ගත හැකි වන්නේ, සූත්‍ර සක්ඣායනයෙන් හා ධර්ම පුහුණුව තුලිනි.

සූත්‍ර සක්ඣායනය යනු, බුදුන් වහන්සේට හා ධර්මයට කෘතවේදීත්වය පුදකරමින් වන්දනා කිරීම හා අනෙකුත් කටයුතු තුලින් තම භක්තිය ප්‍රකාශ කිරීමය.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසේයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P99-P104

# අපි එකිනෙකාගේ බුද්ධ ශක්තිය දීප්තිමත් කරගනිමු

මේ මස නිවිකෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩයේ, 'විශ්වාසය හා අවබෝධය' පරිච්ඡේදයේ ඇතුලත් 'දිළිඳු පුත්‍රයාගේ උපමා කථාව' ගැන සඳහන් වේ.

මෙම කාල පරිච්ඡේදයේ, හීනමානයෙන් වෙළී ආත්ම ශක්තියක් නොමැති පුද්ගලයන්ගේ පිරිස වැඩි වුවද 'දිළිඳු පුත්‍රයාගේ උපමා කථාවෙහි' සඳහන් ආකාරයට සියළුදෙනාම බුදුන් වහන්සේගේ දරුවන් වේ. එක් කෙනෙකුට හෝ අඩු නොවී සෑම දෙනා තුලම වටිනා දීප්තිමත් බුද්ධ ශක්තිය තිබේ. එසේ තමා හා අන්‍යයන් තුල තිබෙන බුද්ධ ශක්තිය විශ්වාසයෙන් යුතුව අවබෝධ කර ගෙන, ආත්ම ශක්තියෙන් යුතුව ජීවිතය ගත කිරිම වැදගත් වේ.

බෝධිසත්වයන් කෙනෙකු ලෙස අපගේ කාර්යය නම්, තමා පමණක් නොව, සෑම සියළු දෙනාටම සතුට හා බලාපොරොත්තුව ලබාදෙන ලෙස කටයුතු කිරීමයි. ඒ වෙනුවෙන් නැවත නැවත ධර්මය ඉගෙන ගෙන, එදිනෙදා ජීවිතය තුල ධර්මය පුරුදු පුහුණුවීමේ යෙදී, තමාගේ වටිනාකම අවබෝධ කර ගන්නා ආකාරයට ආධ්‍යාත්මික දියුණුව ඇති කරගනිමු.

රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212FAX: 1-808-455-4633
Email: info@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 FAX: 1-650-359-6437
Email: info@rksf.org URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-262-4437
Email: info@rkina.org URL: http://www.rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692042, San Antonio, TX 78269, USA
TEL: 1-210-561-7991 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 FAX: 1-253-945-0261
Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059, West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar, New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo, Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Patiya**
China Clinic, Patiya Sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni,**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar, Ramu Shibu**

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district, Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
2F Ikh Mandal building, Khurenbulag bag, Bayan-Undur sum, Orkhon province, Mongolia

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**